නෙත් FM

# 5 පහේ පන්තිය

★ **අංක 01 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ජාතික කොඩියේ සිංහල ජන වර්ගය නියෝජනය වන්නේ,

(1) කහ පාට සිංහ රූපයෙන් ය. (2) බෝපත් සතරෙන් ය. (3) රතු පැහැති පසුබිමෙන් ය.

02 ජාතික ගීයේ කොටසක් දී ඇත. එහි හිස්තැන්වලට සුදුසු පද තෝරන්න.

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප ......................... ඔබ ම ය අප .........................

(1) විද්‍යා - සත්‍යා (2) භක්ති - ශක්ති (3) සත්‍යා - ශක්ති

03 වෙල් පෙරහැර පවත්වන්නේ,

(1) කතෝලිකයන් ය. (2) හින්දූන් ය. (3) ඉස්ලාම්වරුන් ය.

04 රාජ්‍ය ලාංඡනයේ ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය මූර්තිමත් වන්නේ,

(1) පුන්කලසෙන් ය. (2) ඉර හා හඳෙන් ය. (3) වී කරල්වලින් ය.

05 රූපයේ දැක්වෙන ආකාරයට ඉටිපන්දමක් දල්වා වීදුරු බඳුනකින් වැසූ විට,



(1) ටික වේලාවකින් නිවී යයි. (2) ඉටිපන්දම අවසන් වන තෙක් දැල්වේ.
(3) ඉටිපන්දමේ ආලෝකය වැඩි වේ.

06 ඖෂධීය පානයක් සකසා ගන්නා මලකි.

(1) කතුරුමුරුංගා (2) රණවරා (3) කෙකටිය

07 සතුන්ගෙන් ශාකවලට සිදුවන යහපතක් නොවන්නේ,

(1) බීජ ව්‍යාප්තිය සිදු වීම (2) මල් පරාග පෝෂණය කිරීම (3) මල් හා ගෙඩි කා දැමීම

PAPERMASTER.LK

**08** දළඹුවන් හා ගොළුබෙල්ලන් බහුල ව ආහාරයට ගන්නේ,

(1) ශාක පත්‍ර ය. (2) පොතු ය. (3) අල හා මුල් ය.

**09** ශක්තිමත් කඳක් නොමැති ශාකයකි.

(1) පොල් (2) කොස් (3) ගොයම්

**10** පෙති ගණන සමාන මල් වර්ග මොනවා ද?

(1) වතුසුදු - සල් (2) රත්මල් - නාමල් (3) අරලිය -රෝස

**11** මලක සියුම් කොටස් නිරීක්ෂණයට අපට යොදා ගත හැකි දෙයකි,

(1).අත් කාචය (2) කන්නාඩිය (3) උපැස් යුවල

**12** දුඹුරු හා කළු පැහැති පිහාටු ඇති ඇස් රතු පාට ගොළුබෙල්ලන් ව කැමට කැමති පක්ෂියා වන්නේ,

(1).පඬුවන් බස්සා (2) කෑදැත්තා (3) ඇටිකුකුළා

**13** ලීයක් සුමට කිරීමට යොදා ගන්නා උපකරණය කුමක් ද?

(1) 
(2) 
(3) 

**14** නගුල හා වියගහ භාවිත කරන කර්මාන්තය කුමක් ද?

(1) කෘෂි කර්මාන්තය (2) වඩු කර්මාන්තය (3).පතල් කර්මාන්තය

**15** ශ්‍රී ලංකාව අවසන් වරට යටත් කරගෙන සිටියේ,

(1) ලන්දේසීන් ය (2) ඉංග්‍රීසීන් ය (3) පෘතුගීසීන් ය

**16** ශරීරය වර්ධනය කරන ආහාරයකි,

(1) පැපොල් (2) පරිප්පු (3) පාන්

**17** රෙදි කඩක් භාවිත කර වළක්වා ගත හැකි අනතුරකි,

(1).බල්ලන් සපා කෑම (2) රත් වූ බඳුනකට අත පිළිස්සීම (3) සර්පයකු දෂ්ට කිරීම

**18** අනාරක්ෂිත ස්ථානයකි,

(1) රතිඤ්ඤා පත්තු කිරීම (2) ගංවතුරේ දිය නෑම (3) නාය යන ප්‍රදේශයක්

**19** සරම්ප රෝගය බෝවන්නේ,

(1) මදුරුවන්ගෙනි (2) අපිරිසිදු ජලයෙනි (3) රෝග වාහක පුද්ගලයින්ගෙනි

**20** ස්වභාවික අනතුරකි,

(1) භූමිකම්පා (2) විදුලිසැර වැදීම (3) වාහනයක ගැටීම

**21** සුදු කමිස, දිග කලිසම්, හිස් වැසුම්, අත් හා පා ආවරණ යොදා ගන්නා ක්‍රීඩාව කුමක් ද?

(1) එල්ලේ (2) ටෙනිස් (3) ක්‍රිකට්

PAPERMASTER.LK

22 අපිරිසිදු ජලයෙන් හා අපිරිසිදු ආහාර මගින් පැතිරී යන රෝගයකි,

(1) මැලේරියාව (2) සෙංගමාලය (3) බරවා

23 අධික රුධිර පීඩනය, හෘද රෝග, ස්ථූල බව ඇති වීමට හේතුවකි.

(1) තෙල් අධික ආහාර ගැනීම (2) පලතුරු වැඩිපුර ආහාරයට ගැනීම

(3) එළවළු හා පලතුරු වැඩිපුර ආහාරයට ගැනීම

24 ජාත්‍යන්තර ක්‍රීඩා උළෙලක මැරතන් තරගයකට සහභාගී වී ජයග්‍රහණය නොකළ ද ඉතා ජනප්‍රියත්වයට පත් වූ පුද්ගලයෙකි.

(1) ඩන්කන් වයිට් (2) සුසන්තිකා ජයසිංහ (3) රණතුංග කරුණානන්ද

25 නිල් පැහැති පසුබිමක දැක්වෙන මෙම මාර්ග සලකුණෙන් කියවෙන්නේ,



(1) පදිකයන් මාරු වන ස්ථානය ඉදිරියෙන් (2) පදිකයන් මාරු වන ස්ථානය

(3) ළමුන් මාරු වන ස්ථානය ඉදිරියෙන්

26 බල්බය නොදැල්වෙන අවස්ථාව වන්නේ,

(1)




(2)




(3)




27 චුම්බකයකට ආකර්ෂණය වන දෙයකි.

(1) පනාව (2) තඹ කැබැල්ල (3) යකඩ හෝ වානේ කැබැල්ල

28 බස් රථයක දී නොකළ යුතු දෙයකි.

(1) ටිකට්පතක් ලබා ගැනීම (2) පිටතට යම් යම් දේ විසි කිරීම (3) උදවු අවශ්‍ය අයට උදවු කිරීම

29 තණ්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා
කටු කැලේ ගාලෙ නොලිහා වද දෙනවා මෙම කවිය,

(1) ගැල් කවියකි. (2) පතල් කවියකි. (3) පාරු කවියකි.

30 මෝරන ලද මෑ ඇට ජල බඳුනකට දැමූ විට,

(1) ජලය මත පා වෙයි (2) ජලය මැද රැඳී තිබෙයි (3) ජලයේ ගිලී පතුලේ රැඳෙයි

PAPERMASTER.LK